# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1453/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 21/11/2023<br>පැය 0530 |

**මාධ්‍ය නිවේදනය**

### 01. ගෙවල් බිඳීම්වලට සම්බන්ධ සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2023.11.13 වන දින කොහුවල පොලිස් වසමේ නිවසක් බිඳ රුපියල් නම ලක්ෂ පනස් දහසකට අධික වටිනාකමින් යුතු දේපල සොරකම් කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් විමර්ශන ආරම්භකර තිබුණි.

ඒ අනුව විමර්ශන නිලධාරින්ට ලද තොරතුරකට අනුව අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු 2023.11.20 වන දින උදෑසන කාලයේදී කොහුවල පොලිස් වසමේ බෝධියවත්ත ක්‍රීඩාංගණය අසලදී **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 210 ක්** සමඟ අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වූ දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම්වලදී සොරකම් කරන ලද **ලැප්ටොප් යන්ත්‍ර 03 ක්, අත් ඔරලෝසුවක්, කොණ්ඩ කපන යන්ත්‍රයක්, සුවඳ විලවුන් ඇතුළු දේපල රැසක්** පොලිසිය විසින් සොයාගෙන ඇති ඇත. කොහුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. වාලම්පුරියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.

2023.11.20 වන දින සවස් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය බස් නැවතුම්පල ආසන්නයේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **රුපියල් ලක්ෂ 05ක** මුදලකට **විකිණීමට සූදානම් කර තිබූ වාලම්පුරියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19ක් වූ හීරළුගෙදර, වරාදල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2023.11.20 වන දින දහවල් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ හබරකඩ ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 200ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34ක් වූ අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2023.11.20 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ දෙවටපාර පාලම අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 400ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43ක් වූ මොරටුමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2023.11.20 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වෙහෙරගොඩැල්ල ක්‍රීඩාපිටිය අසලදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 50ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06.** **ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.**

2023.11.20 වන දින සවස් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ වලව්වත්ත ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා ලීටර් 1284 ක් (බැරල් 07) ක් පෙරීමේ උපකරණ** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39ක් වන ගල්කැටිය, බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්සිංහල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - සීදූව පොලිස් වසම.

2023.11.20 වන දින උදෑසන කාලයේ සීදූව පොලිස් වසමේ කොළඹ හලාවත මාර්ගයේ දඬුගම ගුවන් හමුදා මාර්ග බාධකය අසලදී කොළඹ දෙස සිට හලාවත දෙසට ධාවනය වූ ලංගම බස් රථයක පිටුපස පා පුවරුවේ ගමන් කරමින් සිටි අඹු සැමි යුවලක් පාපුවරුවෙන් බිමට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව සීදූව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 56ක් වූ අම්බලන්මුල්ල, සීදූව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. පිරිමි පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා රාගම රෝහලට ඇතුලත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**